# කෘෂි කාලගුණ උපදේශනය 2022 ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාස සඳහා

## ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ජූලි සහ සැප්තැම්බර් මාස තුළදී දිවයිනේ බස්නාහිර, සබරගමුව, වයඹ සහ මධ්‍යම පළාත් වලට සහ ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක වලට වෙනත් වසර වල ලැබෙන වර්ෂාපතනයට වඩා මදක් අඩු වර්ෂාපතනයක් පුරෝකතනය කළ හැක. අගෝස්තු මාසයේදී දිවයිනේ උතුරු පළාතට සමාන්‍යට ආසන්න වර්ෂාපතනයකුත් අනෙක් ප්‍රදේශ වලට (නැගෙනහිර පළාතට හැර) දිගු කාලීන සාමාන්‍යයට වඩා තරමක් අඩු වර්ෂාපතනයක් ලැබෙනු ඇත.

## ශ්‍රී ලංකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහාවාරි ජලාශ වල ජල මට්ටම 45 % දක්වා පහල බැස ඇති නමුත් ජලය අරපරිස්සමින් සැලසුම් සහගතව භාවිත කරන්නේ නම්, කන්නයේ ඉතිරි මාස කීපය බාධාවකින් තොරව පවත්වා ගෙන යාමට හැකිවනු ඇත. මේ වන විට මහා වාරි ජලාශ යටතේ සිදු කරනු ලබන වගා කටයුතු වල ප්‍රගතිය 93 % දක්වා ඉහල අගයක පවතී.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුව ඉලක්කගත වගා බිම් වලින් 84% පමණ වී වගාව සිදු කෙරී ඇති අතර ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියද ඔවුන්ගේ ඉලක්කගත වගා වපසරිය වී හා අතිරේක බෝග වගාවන්ගෙන් සාර්ථක ලෙස ආවරණය කර ඇත.

**මෙම කරුණු සැලකිල්ලට ගනිමින් 2022 යල කන්නයේ ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීම සඳහා කෘෂි කාලගුණ උපදේශනය නිකුත් කිරීමේ කමිටු සාමාජික සාමාජිකාවන් විසින් පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරනු ලබයි.**

- මේ වනතුරු තම වගා කටයුතු ආරම්භ කර නොමැති ගොවිමහතුන්, කන්නයේ ඉතිරි කාලය තුළ සුදුසු අතිරේක බෝග වගාවක් තෝරා ගැනීමට යොමුවීම රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා වැදගත්වේ.
- වගා කටයුතු ආරම්භ කරන ලද ගොවි මහතුන්ට තම අස්වනු නෙලීමේ කටයුතු ජූලි මස අග වන විටවත් අවසන් කර ගැනීමට හැකි නම්, තුන්වන අතරමැදි කන්නයක් සඳහා ඉක්මනින් යොමු විය හැකිය. මේ සඳහා කෙටි කාලීන රනිල බෝග යොදා ගැනීම වඩාත් සුදුසු වේ.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත පවතින බීජ තොග පිළිබඳ තොරතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයෙන් ලබා ගත හැකිය.
- කන්නයේ ඉදිරි කාලය සඳහා සුදුසු අතිරේක බෝග වර්ගයක් තෝරා ගැනීමේදී සැප්තැම්බර් මස අවසාන සතියේ ඇතිවිය හැකි කෙටි කාලීන තද වැසි තත්ත්වය ගැනද, එළඹෙන 2022/23 මහ කන්නය නිසි වේලාවට ආරම්භ කිරීම සඳහා අතරමැදි කන්නයේ වගාවන් නිසි කාලයට අවසන් කිරීම පිළිබඳව හා බෝග සඳහා ප්‍රමාණවත් වාරි ජලය, වාරි ජලාශ වලින් ලබා ගැනීමට හැකියාව ඇති ද යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
- විශේෂයෙන් අතරමැදි හා වියලි කලාප වලට පවතින වියලි කාලගුණ තත්වය යටතේ අතිරේක බෝග වගාව සඳහා වෛරස් රෝග පැතිරීමේ අවධානමක් පවතින බැවින්, බීජ ප්‍රතිකාර ක්‍රම වෙත යොමු වීම වැදගත් වේ.
- අස්වනු නෙලීමේ කටයුතු සඳහා අගෝස්තු මස මැද භාගය දක්වා ගත වන ගොවි මහතුන්ට මුං වගාව සඳහා පමණක් යොමු වීම සුදුසු බවට නිර්දේශ කරනු ලැබේ. එම ගොවි මහතුන්ට, වගාව වෛරස් ආසාදන වලින් ආරක්ෂා කර ගැනීම සඳහා පහත කරුණු අනුගමනය කළ හැකිය.
  - වගා බිම පුරා ඒකාකාරව පැතිරුණු වගාවක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. මේ සඳහා අක්කරයට මුං බීජ කිලෝ 10 ක් පමණ යොදා ගැනීම සුදුසුය.
  - වෛරස් ආසාදන හැකි ඉක්මනින් හඳුනාගෙන, අසාදිත ශාක ක්ෂේත්‍රයෙන් ඉවත් කර, විනාශ කර දැමිය යුතුය.
  - මේ වනවිට කන්න දෙකක් පමණ පසට සැලකිය යුතු රසායනික පොහොර ප්‍රමාණයක් යෙදීම සිදු නොවූ බැවින්, සපයා ගත හැකි පරිදි යූරියා, කාබනික පොහොර හෝ දියර පොහොර වගාවට යෙදීම සුදුසුය.
- මේ වන විට අම්පාර, මඩකලපුව වැනි ප්‍රදේශ වල අස්වනු නෙලීමේ කටයුතු ආරම්භ වී ඇති නමුත්, කන්නය එකවර ආරම්භ නොකිරීම නිසා, අස්වනු නෙලීමේ කටයුතු සැප්තැම්බර් අගභාගය දක්වා දිවෙනු ඇත. මෙම තත්ත්වය වාරි ජලය විශාල වශයෙන් අපතේ යාමට හේතු වන අතර ගොවි මහතුන් ජලය සුරැකිව භාවිතා කරමින් හැකි තරම් වාරි ජලය ආරක්ෂා කර ගැනීමට යොමුවීම වැදගත්ය.
- වී වගාවන්ගේ අස්වනු නෙලීමේ කටයුතු වල දින තීරණය කිරීමේදී, ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන කෙටි කාලීන කාලගුණ අනාවැකි ගැන අවධානය යොමු කිරීම වැදගත්ය.එසේම අස්වනු නෙලීම සඳහා යොදා ගන්නා යන්ත්‍ර හා එම යන්ත්‍ර සඳහා ඉන්ධන ලබා ගැනීමේ ගැටළු පවතින බැවින්, අස්වනු නෙලීමේ කටයුතු සැලසුම් කිරීම වැදගත් වනු ඇත.
- එළඹෙන 2022/23 මහ කන්නය සඳහා, ස්වයං බිත්තර වී නිෂ්පාදනය මෙන්ම අනෙකුත් අතිරේක බෝග හා එළවලු බීජ සංචිත තබා ගැනීම වැදගත් වන බව කෘෂිකර්ම දෙපාර්තමෙන්තුව අවධාරණය කරයි.
- එළවලු වගාව මෙන්ම ගෙවතු වගාව කෙරෙහි යොමු වීම වැදගත් වන අතර, තෙත් කලාපය සඳහා දිගු කාලීන කාලගුණ අනාවැකියට අනුව සාමාන්‍යට වඩා අඩු වැසි ලැබිය හැකි වුවද, කෙටි කාලීන තද වැසි විටින් විට ඇතිවිය හැකි බැවින්, ජලය හොඳින් බැස යන පස් සහිත සුදුසු ඉඩම් තෝරා ගැනීම, උස පාත්ති සකස් කිරීම, ජලය හොඳින් බැස යන පරිදි කාණු පද්ධති සකස් කිරීම වැනි ක්‍රම අනුගමනය කිරීම වැදගත් වේ.


### කෘෂි කාලගුණ උපදේශක කමිටු සාමාජික සාමාජිකාවන්

- අනුෂා වර්ණසූරිය මිය (අධ්‍යක්ෂ - දේශගුණ විපර්යාස සහ පර්යේෂණ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- ඩී.කේ.ඩබ්.ආර්. සෙනවිරත්න මිය (අධ්‍යක්ෂ-කෘෂිකර්ම) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- ඞී.ඞී. පෙරේරා මහතා (තාක්ෂණික නිලධාරි - ජල කළමනාකරණ අංශය) ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- ආචාර්ය එම්.ඒ.පී.ඩබ්.කේ. මලවිආරච්චි මහතා (ප්‍රධාන කෘෂි විද්‍යාඥ - කෘෂි විද්‍යාව) ක්ෂේත්‍රබෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
- කේ.ඒම්.ඩී.ඩබ්.පී. නිශාන්ත මහතා (අතිරේක අධ්‍යක්ෂ, පැළැටි සංරක්ෂණ සේවාව) උද්‍යානබෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
- එල්.සී. සිල්වා මහතා (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ - ශාකකායික විද්‍යා) වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
- ටී.ඒම්.පි.පී.එස්.පී. තෙන්නකෝන් මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ) ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය
- අරුණි බී. අබේසේකර මිය (සහකාර කාෂිකර්ම අධ්‍යක්ෂ - කෘෂි දේශගුණ හා දේශගුණ විපර්යාස) ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය

### විශේෂ ස්තුතිය

- ගාමිණී සේනාරත්න මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ) බෝග සම්බන්ධීකාරක (මුං) - සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය, අගුණකොලපැලැස්ස
- රමණී ආර්. සෙනරත් මිය (අතිරේක අධ්‍යක්ෂ -එළවලු බීජ හා රෝපණ ද්‍රව්‍ය) බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය
- ඊ.එම්.පී.කේ.එදිරිසූරිය මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ-අතිරේක ආහාර බෝග) බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය

### සම්පාදනය

- අරුණි බී. අබේසේකර මිය (සහකාර කාෂිකර්ම අධ්‍යක්ෂ - කෘෂි දේශගුණ හා දේශගුණ විපර්යාස) ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය